# Ceylon Govt. Gazette

**EXTRAORDINARY**

**Published by Authority.**

**No. 5,112—SATURDAY, JANUARY 16, 1892.**

## ආණ්ඩුව විසින් දන්වන වගතම්.

බ්‍රිතාන්‍ය රාජ්‍යයේ ප්‍රදේශභාරවූ ඉතා ගරුකටයුතු මහසෙක්‍රතාරිස් උන්නාන්සේ විසින් ටැලිග්‍රැෆ් කියන විදුලි මාර්ගයෙන් එවනලද්දාවූ මෙහි පහත දක්වන ආරංචිය පොදුජනයාට දැනගැන්ම සඳහා ප්‍රසිද්ධකරන්ට ගරුතර ආණ්ඩුකාර උතුමානන්වහන්සේ විසින් ආඥාකරණලදී.

කේ. සී. ඇම්. ජී. යන ගෞරවාන්විත නාමය දරණ සර් ඒ. ඊ. හැව්ලොක් උතුමානන් වහන්සේට ඉතා ගරුකටයුතු ආණ්ඩුවේ මහසෙක්‍රතාරිස් උන්නාන්සේ විසින් දන්වන වගතම්.

වර්ෂ 1892 ක්වූ ජනවාරි මස 14 වෙනි දින ඩෞනිං ස්ට්‍රීට් කියන ස්ථානයේදීය.

අද නමයහමාරට කලරැන්ස්හි නගරාදිපාදයන් පරලෝකප්‍රාප්තවූ බව මහත් කනගාටුවෙන් දන්වමි.

මහාරාජිනීන්වහන්සේටද වේල්ස් රටේ කුමාරෝත්තමයානන්ට හා කුමාරිකාවන්ටද පැමිණි මහත් පාඩුව සම්බන්ධවූ දුඃඛිත ආරංචිය ලැබූ විට මහාරාජිනීන්වහන්සේගේ ලංකාද්වීපයේ විශ්වාසවූ පක්ෂපාත යටත් වැසියන් විසින් මුළුහෘදයෙන් කනගාටුවට පැමිණෙනකියා ගරුතර ආණ්ඩුකාර උතුමානන්වහන්සේ විශ්වාසකරණවාය.

ආණ්ඩුකාර උතුමානන්වහන්සේගේ ආඥාවපිට එළිදරව්කළබවට,

(අත්සන්කලේ) ඊ. නොඑල් වාකර්,

මහසෙක්‍රතාරිස් වම්හ.

වර්ෂ 1892 ක්වූ ජනවාරි මස 15 වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස්උන්නාන්සේගේ කන්තෝරුවේදීය.